ජයතිලක, ඩබ්ලිව්.ඒ. එච්.
PAPER

## පැරණි ලක්දිව රජවරුන් තුලාභාර දාන දුන්නේ ජන ප්‍රසාදය දිනාගැනීම සඳහා ද යන්න පිළිබඳ විමර්ශනයක්

ඩබ්ලිව්.ඒ. එච්. ජයතිලක, ඉතිහාසය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

තුලාභාර දාන යනු යම් පුද්ගලයෙකු හෝ කිහිපදෙනෙකු තරාදියේ එක් පැත්තකට නැග තමාගේ බරට සමානව සිටින සේ තරාදියේ අනෙක් පැත්තට වස්තුව පුරවා කිරා දන්දීමයි. සංක්ෂිප්තව හඳුනාගන්නේ නම් බරට බර දන්දීමකි. ඒ සඳහා කටයුතු කළ පාලකයා ජන ප්‍රසාදය දිනූ දානපතියකු බවට පත් වූ වග අනාවරණය කර ගත හැකි ය. මේ පුණ්‍ය කටයුත්ත සිදු කළ ආකාරයන් විවිධ ය. එහිදී තුලාභාර දානය විශේෂිත වේ. මේ සිරිත පැරණි ලක්දිව රජවරුන් ද ක්‍රියාවට නංවා තිබේ. අනුරාධපුර පොළොන්නරු යුගයන්හිදී මෙරට පාලකයන් දුන් තුලාභාර දාන හා එම දාන ලබාදීමේ අරමුණු පිළිබඳව විමර්ශනයක් කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ විය.

තුලාභාර දානයේ ආරම්භය පිළිබඳ පරීක්ෂා කිරීමේදී ඉන්දියානු දේශපාලනය තුළින් ද මෙම පුණ්‍ය කටයුත්ත සාර්ථකව පාලන තන්ත්‍රයක් තුළ පවත්වාගෙන ආ බව අනාවරණය වෙයි. එමෙන් ම බෞද්ධ ජාතක කථා ඇසුරෙන් සතුන්ගේ බරට වස්තුව දන්දෙන ලද අවස්ථා ද හමුවේ. මෙය රජු පෞද්ගලිකව සිදු කළ ද රජු වෙතින් ජනයාට ලද ජන ප්‍රසාදයකි. සුභසාධනයකි. මෙහිදී ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍රය පරිශීලනය කිරීම පර්යේෂණ ක්‍රමවේදය ලෙස යොදා ගැනුණි.

අනුරාධපුර රජවරුන් තනිව දුන් තුලාභාර දානය පොළොන්නරු යුගය වන විට රාජකීය පවුල තුළට විසරණයවීමක් දක්නට ලැබේ. නිශ්ශංකමල්ල රජතුමාගේ පාලන කාලය තුළ පෙර රජවරුන් නොකළ ආකාරයේ තුලාභාර දානයන් දී තිබේ. එහෙත් පොළොන්නරු යුගයෙන් පසුව මේ සිරිත ක්‍රමයෙන් අභාවයට යන්නට ඇත. රාජ්‍ය අනුග්‍රහය මත ඉතා විධිමත් ආකාරයෙන් පවත්වාගෙන යනු ලැබූ තුලාභාර දානය, රාජ්‍යය, රජු හා ජනයා සුරක්ෂිත කරලීම පිණිස මහත් පිටුවහලක් වී ඇත. මේ තුළින් විවිධාකාරයේ අවශ්‍යතා සපුරාගැනීමට ජනතාවට හැකියාව ලැබෙන්නට ඇත.

තුලාභාර දානය ලක්දිව බොහෝදුරට භාවිත කර ඇත්තේ උත්සවාකාරයෙනි. එමෙන් ම මෙරට පැවැත් වූ තුලාභාර දානය තුළින් දන් දුන් වස්තු පිළිබඳව ද කරුණු හෙළිදරව් කර ගැනීමේ හැකියාව පවතී. පැරණි ලක්දිව තුලාභාර දානය දේශපාලන ක්ෂේත්‍රයට, ජනතා ප්‍රසාදයට හා සුභසාධනයට ඉහළ දායකත්වයක් ලබා දුන් බව මෙමගින් නිගමනය කළ හැකි ය.